7188

OL/2017/43-S-I (OLD)

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

පැරණි නිර්දේශය/பழைய பாடத்திட்டம்/Old Syllabus

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

OLD

43 S I

| පත්‍රය | ලකුණු |
|---|---|
| I | |
| II | |
| III | |
| එකතුව | |
| පරීක්ෂක 1 | |
| පරීක්ෂක 2 | |
| ගණිත පරීක්ෂක | |

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2017 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2017 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2017

චිත්‍ර I
சித்திரம் I
Art I

පැය එකයි
ஒரு மணித்தியாலம்
One hour

විභාග අංකය :......................................

- පහත සඳහන් ඡායාරූපය ඇසුරු කරගෙන අංක 1 සිට 5 තෙක් ප්‍රශ්නවල හිස්තැන් පුරවන්න.



1. මෙම වාස්තු විද්‍යා නිර්මාණය ඉදිවූයේ ...................................... යුගයේ දී ය.

2. මෙය ................................................ නමින් හැඳින්වේ.

3. මෙය කරවන ලද්දේ ................................................ රජ දවසේ දී ය.

4. මෙය ඉදිකරන ලද්දේ .................................. ආරක්ෂාව පිණිස ය.

5. මෙහි අභ්‍යන්තරයේ පිහිටා ඇති බුදු පිළිම ........................................ මුද්‍රාවෙන් යුක්ත වේ.

[දෙවැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

- අංක 6 සිට 10 තෙක් දී ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

**6.** දෙගල්දොරුවේ 'ඇලි ඇතු දන්දීම' කුමන ජාතක පුවතක් හා සම්බන්ධ ද?

.....................................................................................

**7.** සුප්‍රසිද්ධ කාටූන් චරිතයක් වූ 'පුංචි සිංඤෝ' නිර්මාණය කළ ශිල්පියා කවුද?

.....................................................................................

**8.** ඉස්ලාමීය දේවස්ථානයක පිවිසුමෙහි දෙපස උසට විහිදී යන සේ තනා ඇති කුලුනු කුමන නමකින් හැඳින්වේ ද?

.....................................................................................

**9.** ඉන්දු නිම්නයෙන් හමු වූ මූර්ති අතර ලෝකඩ මාධ්‍යයෙන් නිමවා ඇති මූර්තිය කුමක් ද?

.....................................................................................

**10.** 'අවසාන භෝජන සංග්‍රහය' නමැති සිතුවම නිර්මාණය කළ ඉතාලි ජාතික චිත්‍ර ශිල්පියා කවුද?

.....................................................................................

- අංක 11 සිට 15 තෙක් දී ඇති එක් එක් ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුර තෝරා, ඊට යටින් ඉරක් අඳින්න.

**11.** මහනුවර යුගයේ සිතුවමින් හා සැරසිලිවලින් අලංකාර වූ සුවිසල් වියන් චිත්‍ර සහිත විශාලතම විහාරය
(1) දෙගල්දොරුව විහාරයයි. (2) මැදවෙල ටැම්පිට විහාරයයි.
(3) දඹුල්ල ලෙන් විහාරයයි. (4) මහනුවර දළදා මැදුරයි.

**12.** අනුරපුරයේ ධාතුසේන රජු දවස කරවන ලදැයි සැලකෙන බුදු පිළිමය වනුයේ,
(1) සමාධි බුදු පිළිමයයි. (2) අවුකන බුදු පිළිමයයි.
(3) පන්කුලිය බුදු පිළිමයයි. (4) තොලුවිල බුදු පිළිමයයි.

**13.** පොළොන්නරුවේ හින්දු කෝවිල් ආශ්‍රිතව හමු වූ පාර්වතී මූර්තිය
(1) ස්ත්‍රී ලාලිත්‍යය පෙන්වන හින්දු ලෝකඩ මූර්තියකි.
(2) පර්වතයේ විසූ තැනැත්තිය හැඳින්වීමට තෙළන ලද්දකි.
(3) ශිව දෙවියන්ගේ පතිනිය නිරූපණය කරන්නකි.
(4) දකුණු ඉන්දීය මූර්තිමය ලක්ෂණ නිරූපිත මූර්තියකි.


**14.** සාරානාත් කෞතුකාගාරයේ තැන්පත් කර ඇති සාරානාත් බුදු පිළිමය,
(1) ධම්මචක්ක මුද්‍රාවෙන් ගුප්ත යුගයේ තෙළන ලද්දකි.
(2) විසිතුරු ප්‍රභා මණ්ඩලයක් සහිත ප්‍රසන්න පිළිමයකි.
(3) සාරානාත් ගුරුකුලයේ තෙළන ලද පිළිම අතුරෙන් එකකි.
(4) බුදුන්ගේ මහා පෞරුෂය දැක්වෙන ඉන්දීය පිළිමයකි.


**15.** පිකාසෝගේ 'ගුවර්නිකා' සිතුවමින් ප්‍රකාශ වනුයේ,
(1) වර්ණ ඇසුරෙන් ගැඹුරු අරුතක් ප්‍රකාශ කළ හැකි බවයි.
(2) ව්‍යුක්ත හැඩතල තුළින් භාවමය අදහස් ප්‍රබලව ප්‍රකාශ කළ හැකි බවයි.
(3) සංකේත භාවිතය තුළින් හැඟීම් ප්‍රකාශ කළ හැකි බවයි.
(4) තාත්ත්වික ප්‍රකාශනය හැඟීම් ප්‍රකාශනයට බාධාවක් බවයි.


[තුන්වැනි පිටුව බලන්න.


Department of Examinations Sri Lanka


- අංක **16** සිට **20** තෙක් දී ඇති එක් එක් රූපසටහන්වලට සමීප සබඳතාවක් දක්වන රූපසටහන, ඉදිරියෙන් ඇති **A, B, C, D, E** යන ඒවා අතුරෙන් තෝරා, එහි අක්ෂරය **තිත් ඉර මත** ලියන්න.


**16.**  (.........)

**17.**  (.........)


**18.**  (.........)


**19.**  (.........)

**20.**  (.........)

 **A**

 **B**

 **C**

 **D**

 **E**

- අංක **21** සිට **25** තෙක් දී ඇති එක් එක් වාක්‍යයෙහි හිස්තැනට සුදුසු වචනය/වචන යොදා සම්පූර්ණ කරන්න.

**21.** බතික් සැරසිලි හා සන්නිදර්ශන චිත්‍ර නිර්මාණයේ දස්කම් පෑ ............................................ චිත්‍ර කලා පරීක්ෂකවරයකු ද විය.

**22.** අජන්තා ගුහා අතර වැඩි ගුහා ප්‍රමාණයක් නිර්මාණය වී ඇත්තේ ................................................ ශාලා ලෙස ය.

**23.** බටහිර තාත්ත්වික චිත්‍ර කලා ශෛලිය අනුගමනය කරමින් ලිතෝ මුද්‍රිත බෞද්ධ චිත්‍ර ගණනාවක් සිතුවම් කළ .............................. ශිල්පියා විහාර චිත්‍ර කලාවට මහත් මෙහෙවරක් කළ අයෙකි.

**24.** 'ලැවොකූන්' ග්‍රීසියේ ........................................ යුගයේ නිර්මාණය වූ ශ්‍රේෂ්ඨ නිර්මාණයකි.

**25.** ස්වාභාවික සත්ත්ව රූප හා ශෛලිගත මානව රූප යොදා නිමවා ඇති මිසර සිතුවම .............................. නමින් හැඳින්වේ.

[හතරවැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka

7188

● අංක **26** සිට **30** තෙක් දී ඇති ප්‍රශ්නවලට **F, G, H, I, J** යන රූපසටහන් ඇසුරෙන් පිළිතුරු සපයන්න.


F


G


H


I


J

**26.** **F** අක්ෂරයෙන් දැක්වෙන ඇම්බැක්ක දේවාලයේ කැටයම කුමන නමකින් හැඳින්වේ ද?

..........................................................

**27.** **G** අක්ෂරයෙන් දැක්වෙන කැටයමේ අශ්ව හිසෙන් සංකේතවත් කරන්නේ කුමක් ද?

..........................................................

**28.** **H** අක්ෂරයෙන් දැක්වෙන ගීසාහි කුෆු පිරමීඩය අසල පිහිටි මෙම කල්පිත රූව කුමන නමකින් හැඳින්වේ ද?

..........................................................

**29.** **I** අක්ෂරය දැක්වෙන මුද්‍රාවෙන් නිරූපණය වනුයේ කවරෙකු ද?

..........................................................

**30.** **J** අක්ෂරයෙන් දැක්වෙන රූව කුමන ස්ථානයක දක්නට ලැබේ ද?

..........................................................

● අංක **31** සිට **35** තෙක් දී ඇති වචනවල අර්ථය පැහැදිලි වන සේ සම්පූර්ණ වාක්‍යය බැගින් ලියන්න.

**31.** ගෝපුර : ..........................................................................................................

..........................................................................................................

**32.** ප්‍රභාමණ්ඩලය : ..........................................................................................................

..........................................................................................................

**33.** වාත්තු කිරීම : ..........................................................................................................

..........................................................................................................

**34.** හර්මිකා : ..........................................................................................................

..........................................................................................................

**35.** පැපිරස් : ..........................................................................................................

..........................................................................................................

[පස්වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

- පහත දැක්වෙන සිතුවම හඳුනාගෙන එහි කලාත්මක අගය විග්‍රහ කෙරෙන පරිදි අංක **36** සිට **40** තෙක් දී ඇති උපමාතෘකාවලට අදාළ ව **අර්ථවත් වාක්‍යය** බැගින් ලියන්න.



**36.** ස්ථානය හා ශිල්පියා : ..............................................................................................

..............................................................................................

**37.** තේමාව : ..............................................................................................

..............................................................................................

**38.** රේඛාව හා වර්ණ භාවිතය : ..............................................................................................

..............................................................................................

**39.** සංරචනය : ..............................................................................................

..............................................................................................

**40.** හැඟීම් ප්‍රකාශනය : ..............................................................................................

..............................................................................................

* * *

Department of Examinations Sri Lanka

OL/2017/43-S-II (OLD)

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

පැරණි නිර්දේශය/பழைய பாடத்திட்டம்/Old Syllabus

OLD

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

43 S II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2017 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2017 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2017

චිත්‍ර II
சித்திரம் II
Art II

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**සැලකිය යුතුයි :**

- ✳ ඔබේ **විභාග අංකය** උත්තර පත්‍රයේ **පසු පිටේ** දී ඇති තීරුවේ පැහැදිලි ව ලියන්න.
- ✳ උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට භාර දෙන විට වියළී තිබිය යුතු ය. තෙත් චිත්‍ර එකට ඇලී තිබීම ඔබට අවාසිදායක විය හැකි ය.
- ✳ දිය සායම්, පෝස්ටර් සායම්, ටෙම්පරා සායම්, පැස්ටල් හෝ අතේ නොගෑවෙන ඕනෑ ම වර්ණ මාධ්‍යයක් හෝ භාවිත කළ හැකි ය.
- ✳ සියලු ම ද්‍රව්‍ය ඇස් මට්ටමෙන් පහළ සිටින සේ තැබීමට ශාලාධිපතිවරුන්ට උපදෙස් දී ඇත. එසේ නොතැබූ අවස්ථාවක් වුවහොත්, ඇඳීම පටන් ගැනීමට පෙර, විභාග ශාලාධිපතිට දැන්වීමට ඔබට අවසර තිබේ.

---

## නිදහස් රේඛාමය ඇඳීම හා වර්ණ චිත්‍ර සම්පිණ්ඩනය

✳ ඔබ ඉදිරියේ තබා ඇති ද්‍රව්‍ය සමූහය හොඳින් නිරීක්ෂණය කොට,

1. රේඛා මගින් පූර්ව අධ්‍යයනයක යෙදෙන්න. මේ සඳහා ඔබට සපයා ඇති රළු කඩදාසිය භාවිත කරන්න.
2. ද්‍රව්‍ය සමූහය ඔබට පෙනෙන අයුරින් ඇඳ, වර්ණ කරන්න. මේ සඳහා සපයා ඇති විශේෂ කඩදාසිය භාවිත කරන්න.

✳ **මෙම චිත්‍ර දෙක ම එකට අමුණා විභාග ශාලාධිපතිට භාර දෙන්න.**

✳ ඔබේ චිත්‍රය ඇගයීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි සැලකිලිමත් වන බව සලකන්න.

- **රේඛා අධ්‍යයනය**

1. මුල් කඩදාසියේ කරනු ලබන පූර්ව අධ්‍යයනයේ දී දක්වා ඇති කුසලතා

- **වර්ණ චිත්‍රය**

2. ද්‍රව්‍ය සමූහය, තලය මත කලාත්මක ව සම්පිණ්ඩනය වීම
3. පරිමාණ, පර්යාලෝක රීති හා ත්‍රිමාණ ලක්ෂණ පිළිබඳ අවබෝධය
4. දෙන ලද ද්‍රව්‍ය සමූහයේ මතුපිට ස්වභාවය හා ගතිලක්ෂණ දැක්වීම
5. වර්ණ හැසිරවීමේ ශිල්පීය කුසලතා
6. උචිත පසුබිමක් යෙදීම හා සමස්ත නිමාව

**සැලකිය යුතුයි:**

ද්‍රව්‍ය සමූහය තබා ඇති ලැල්ල විශාල ලෙස ඇඳීම අවශ්‍ය නො වේ. ලැල්ලේ පරිමාණය ද්‍රව්‍ය සමූහයට ගැළපෙන අයුරින් වෙනස් කර ඇඳීමට ඔබට අවසර ඇත.

✳ ✳ ✳

Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka

OL/2017/43-S-III (OLD)

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

පැරණි නිර්දේශය/பழைய பாடத்திட்டம்/Old Syllabus

OLD

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

43 S III

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2017 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2017 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2017

චිත්‍ර III
சித்திரம் III
Art III

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
*Two hours*

**සැලකිය යුතුයි :**

* ඔබ ඇඳිය යුත්තේ **එක** චිත්‍රයක් පමණි.
* ඔබේ **විභාග අංකය** හා අදාළ **ප්‍රශ්න අංකය** උත්තර පත්‍රයේ **පසු පිටේ** දී ඇති තීරුවේ පැහැදිලි ව ලියන්න.
* උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට භාර දෙන විට වියළී තිබිය යුතු ය. තෙත් චිත්‍ර එකට ඇලී තිබීම ඔබට අවාසිදායක විය හැකි ය.
* දිය සායම්, පෝස්ටර් සායම්, පැස්ටල් ඇතුළු අතේ නොගෑවෙන ඕනෑ ම වර්ණ මාධ්‍යයක් වර්ණ කිරීම සඳහා භාවිත කළ හැකි ය.
* ඇඳීමේ සුදු කඩදාසි හා අවශ්‍ය අයට ටිෂූ කඩදාසි සපයනු ලැබේ.

'අ' කොටසින් හෝ 'ආ' කොටසින් හෝ 'ඉ' කොටසින් හෝ **එක් මාතෘකාවක් පමණක් තෝරාගන්න.**

**'අ' කොටස - චිත්‍ර සංරචනය**

1. වැල්ලේ මාලු වෙළෙන්දෝ/නගරයේ පදික වෙළෙන්දෝ
2. දියට ඇදෙන ඇත් රැළක්
3. දිය ගෙන යාමට ළිඳ ළඟට ආ යෙහෙළියෝ
4. නොනිදන නගරය

**'ආ' කොටස - මෝස්තර නිර්මාණය**

5. චිත්ත රෙද්දක් සඳහා ව්‍යාප්ත මෝස්තරයක අඟල් **9 × 9** ප්‍රමාණයේ කොටසක් මලක් හා කොළයක් ඇසුරෙන් නිර්මාණය කරන්න. ව්‍යාප්ත වන ආකාරය පිළිබඳ ව සැලකිලිමත් වන්න.
6. වෘත්තාකාර පිත්තල බන්දේසියකට සුදුසු කැටයම් අලංකරණයක්, ඒක කේන්ද්‍රීය ව විහිදී යන සේ පාරම්පරික මෝස්තර ඇසුරෙන් නිර්මාණය කරන්න.
7. අඩි **4 × 3** ප්‍රමාණයේ සෘජුකෝණාස්‍රාකාර මේස රෙද්දක් අලංකාර කිරීම සඳහා මුලුතල මෝස්තරයක් නිර්මාණය කරන්න.

**'ඉ' කොටස - ග්‍රැෆික් චිත්‍ර**

8. 'අළි පැංචා' නමින් වූ ළමා පොතක් සඳහා විචිත්‍රවත් පිටකවරයක් සැලසුම් කරන්න.
9. 'ඩෙංගු මාරාන්තිකයි' මැයෙන් පෝස්ටරයක් නිර්මාණය කරන්න.
10. පාසලේ වාර්ෂික විවිධ ප්‍රසංගය සඳහා විචිත්‍රවත් ආරාධනා පත්‍රයක් නිර්මාණය කරන්න.

* * *

Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka